සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

63 S I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

**නම/විභාග අංකය : ..................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - I කාලය : පැය 03 යි.**

වැදගත් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

(1) සහජයෙන් ම උරුමවිය හැකි මෙන්ම අධ්‍යාපනය හා පළපුරුද්ද තුළින් සකස් කරගත හැකි හා වර්ධනය කරගත හැකි දෙයකි,
1. ව්‍යවසායකත්වය
2. නවෝත්පාදනය
3. නිර්මාණශීලීත්වය
4. අවදානම් කළමනාකරණය

(2) නිෂ්පාදනය සඳහා යොදාගන්නා ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලුම සම්පත් හඳුන්වන්නේ,
1. ශ්‍රමය ලෙස ය.
2. ප්‍රාග්ධනය ලෙස ය.
3. භූමිය ලෙස ය.
4. ව්‍යවසායකත්වය ලෙස ය.

(3) වඩු කාර්මිකයෙකු වූ රදීෂ් වනයේ ඇති ගස් කපා යන්ත්‍ර සූත්‍ර යොදාගෙන ලී බඩු නිෂ්පාදනය කරයි. මෙහි සඳහන් වන නිෂ්පාදන සාධක ගණන කීයද?
1. 2 කි.
2. 3 කි.
3. 4 කි.
4. 5 කි.

(4) ව්‍යවසායකත්වය තුළින් බිහිවන්නේ,
1. නවෝත්පාදනයකි.
2. භාණ්ඩයකි.
3. සේවාවකි.
4. නිෂ්පාදිතයකි.

(5) ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට ඇති හැකියාව හඳුන්වන්නේ,
1. නවෝත්පාදනය ලෙස යි.
2. නම්‍යශීලීත්වය ලෙසයි.
3. කැපවීම ලෙස යි.
4. නිර්මාණශීලීත්වය ලෙසයි.

(6) ව්‍යවසායකයා විසින් ගනු ලබන තීරණයක් නොවන්නේ,
1. නිෂ්පාදනය කරනු ලබන්නේ කවර භාණ්ඩ හෝ සේවාද?
2. කවර නිෂ්පාදන සාධක සංයෝග කරන්නේද?
3. නිෂ්පාදන සාධක සංයෝග කරන්නේ කෙසේද?
4. කොපමණ ප්‍රමාණයක් නිපදවා ගත යුතු ද?

(7) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පමණක් ඇතුළත් ඛාණ්ඩය වන්නේ,
1. සුභවාදී බව, දක්ම, නායකත්වය, කැපවීම.
2. නම්‍යශීලීත්වය, සුභවාදී බව, දක්ම, නායකත්වය
3. ස්වාධීනත්වය, සුභවාදී බව, නවෝත්පාදනය, දක්ම
4. ස්වාධීනත්වය, සුභවාදී බව, දක්ම, හැකියාව

(8) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම,

1. නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි සාධකයකි.
2. නිර්මාණශීලීත්වයට බාධාකාරී සාධකයකි.
3. නිර්මාණශීලීත්වයට අත්‍යවශ්‍ය සාධකයකි.
4. නිර්මාණශීලීත්වයට හේතුවකි.

(09) නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ගයකි.

1. සාර්ථකත්වය ඉවසීම.
2. කුතුහලය දිරිමත් කිරීම.
3. වැරදීම් හා විවේචනවලට බියවීම.
4. ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම.

(10) විදුලි දුම්රිය හා ගුවන්යානය අයත් වන නවෝත්පාදන සිදුවන ආකාර දෙක පිළිවෙළින් දැක්වෙන්නේ,

1. දිගුවක්, නවසොයාගැනීමක්
2. සංකලනයක් , දිගුවක්
3. නවසොයාගැනීමක්, දිගුවක්
4. අනුකරණයක්, දිගුවක්

(11) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි.

1. දිගුවක්
2. අනුකරණයක්
3. සංකලනයක්
4. ක්‍රියාවලි අවශ්‍යතාවක්

(12) පෙනිසිලින් සොයා ගැනීම.

1. අනපේක්ෂිත සිදුවීමකි.
2. සංකලනයකි
3. දිගුවකි.
4. ක්‍රියාවලි අවශ්‍යතාවකි.

(13) නව නිපයුම් වෙළඳපොලේ සාර්ථක වීමට හා අසාර්ථකවීමට ඇති ඉඩ ප්‍රස්ථාව හඳුන්වන්නේ,

1. අවිනිශ්චිතතාව ලෙස ය.
2. අවදානම ලෙස ය.
3. නම්‍යතාව ලෙස ය.
4. අනුකරණය ලෙස ය.

(14) අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාව වන්නේ,

1. අවදානම පහල නම් ප්‍රතිලාභය ඉහළ ය.
2. අවදානම ඉහල නම් ප්‍රතිලාභය පහල ය.
3. අවදානම පහල නම් ප්‍රතිලාභය පහල ය.
4. අවදානම හා ප්‍රතිලාභය සමාන ය.

(15) ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බවට ඇති විශ්වාසය තහවුරු වන චරිතයකි.

1. ජෙසිකා කොක්
2. මාරි කියුරි
3. තෝමස් අල්වා එඩිසන්
4. මාරි පාකර්

(16) තෝමස් අල්වා එඩිසන්ගේ චරිතය තුළින් පිළිඹිබුවන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ,

1. නම්‍යශීලීත්වයයි.
2. සුභවාසී බවයි.
3. සාර්ථකත්වය ඉවසීම.
4. අසීරු අරමුණු ඉටුකර ගැනීම.

(17) පුද්ගලයා අනාගතයේ දී සැබෑ කර ගැනීමට වෙර දරණ සිහිනය හඳුන්වන්නේ,

1. පරමාර්ථය ලෙස ය.
2. අරමුණ ලෙස ය.
3. දැක්ම ලෙස ය.
4. ඉලක්ක ලෙස ය.

(18) ව්‍යවසායකයාට තම අභිමතය පරිදි වැඩ කිරීමට සහ තීරණ ගැනීමට අවශ්‍ය නිදහස පැවතීම හඳුන්වන්නේ,

1. ස්වාධීනත්වය ලෙස ය.
2. නිර්මාණශීලීත්වය ලෙස ය.
3. දැක්ම ලෙස ය.
4. නම්‍යශීලීත්වය ලෙස ය.

NWP EXAM

(19) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කමක් වන්නේ,

1. වුවමනා සීමිත වන අතර අවශ්‍යතා අසීමිත වේ.
2. අවශ්‍යතා උප්පත්තියක් සමඟ ඇතිවන අතර වුවමනා ඉපදීමෙන් ටිකකලකට පසුව ඇති වේ.
3. අවශ්‍යතා පළමුව ඇතිවන අතර වුවමනා දෙවනුව ඇතිවේ.
4. අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැක.

(20) අවශ්‍යතා පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. ආහාර, ආරක්ෂාව, විනෝදය, දුරකතන
2. සන්නිවේදනය, ආරක්ෂාව, අධ්‍යාපනය, නිවාස
3. ආරක්ෂාව, විනෝදය, රූපවාහිනිය, නිවාස
4. සන්නිවේදනය, පාසල්, නිවාස, ආරක්ෂාව

(21) පුවත්පත්, විශ්ව විද්‍යාල, සපත්තු මඟින් ඉටුවන අවශ්‍යතා පිළිවෙළින් දක්වෙන්නේ,

1. සන්නිවේදනය, අධ්‍යාපනය, ඇඳුම්
2. විනෝදාංශ, ඇඳුම්, අධ්‍යාපනය
3. අධ්‍යාපනය, ආරක්ෂාව, ඇඳුම්
4. විනෝදාංශ, අධ්‍යාපනය, ප්‍රවාහනය

(22) භාණ්ඩ හා සේවා යන දෙවර්ගයටම පොදු ලක්ෂණයක් වන්නේ,

1. භෞතික පැවැත්මක් පැවතීම.
2. ගබඩා කළ හැකි වීම.
3. සපයන්නාගෙන් වෙන් කළ හැකි වීම.
4. මිනිස් අවශ්‍යතා වුවමනා තෘප්තිමත් කළ හැකි වීම.

(23) ව්‍යාපාරවල ගති ලක්ෂණයක් නොවන්නේ,

1. අරමුණක් පැවතීම.
2. අවදානමක් පැවතීම.
3. ආර්ථික කටයුත්තක් වීම.
4. මූල්‍යමය ගණුදෙනු සැලකිල්ලට නොගැනීම.

(24) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකමකි.

1. ගැටළු නිර්මාණශීලීව විසඳීම.
2. තරඟය හඹායාම.
3. ගනුදෙනුවල නිරත වීම.
4. ස්වයං පෙළඹවීමක් නොතිබීම.

(25) ප්‍රධාන ව්‍යවසායක වර්ග ගණන,

1. 2කි. 2. 3කි. 3. 4කි. 4. 5 කි.

(26) ආයතනික ව්‍යවසායකයෙක් වන්නේ,

1. සිල්ලර වෙළෙන්දා ය.
2. ගාන්ධි තුමන් ය.
3. ගුණත්ව සම්මාන හිමිකරගත් විදුහල්වල ප්‍රධානීන් ය.
4. මාරි කියුරි මැතිණි ය.

(27) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ සියලු කටයුතු හඳුන්වන්නේ,

1. නිෂ්පාදිත ලෙස ය.
2. ව්‍යාපාර ලෙස ය.
3. අලෙවිකරණය ලෙස ය.
4. ව්‍යවසායකත්වය ලෙස ය.

(28) පරිසරයේ වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට ඇති හැකියාව,

1. නිර්මාණශීලීත්වයයි.
2. නව්‍යකරණයයි.
3. නම්‍යශීලීත්වයයි.
4. ගතික බවයි.

(29) නවෝත්පාදන සිදුවන ආකාර අතරින් "අනුකරණය කිරීමක්" යන්න හොඳින් විස්තර වන අවස්ථාව තෝරන්න.

1. LED විදුලි බල්බ යෙදූ වෙසක් තොරණ
2. විද්‍යුත් වෙළඳාම
3. මාළු බෙදාහරින ආකාරයට පාන් අලෙවි කිරීම.
4. ස්මාර්ට් ජංගම දුරකතන භාවිත ය.

NWP EXAM

(30) මිනිසා ජීවත්වීම සඳහා තම අවශ්‍යතා සපුරා ගන්නා ස්වරූපයන් හඳුන්වන්නේ,

1. අවශ්‍යතා ලෙස ය.
2. වුවමනා ලෙස ය.
3. වෙළඳාම ලෙස ය.
4. නිෂ්පාදිත ලෙස ය.

(31) ව්‍යවසායකත්වයෙන් ප්‍රතිලාභ ලැබෙන ආකාර ගණන,

1. 2 කි.
2. 3 කි.
3. 4 කි.
4. 5 කි.

(32) ව්‍යවසායකත්වයෙන් ලැබෙන ප්‍රතිලාභ වර්ගීකරණය වන ආකාරයකි.

1. ප්‍රජාවට හිමිවන ප්‍රතිලාභ
2. සමාජයට හිමිවන ප්‍රතිලාභ
3. ව්‍යාපාරයට හිමිවන ප්‍රතිලාභ
4. ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ

(33) ග්‍රාමීන් ණය යෝජනා ක්‍රමය හඳුන්වාදුන් පුද්ගලයින් හඳුන්වන්නේ,

1. ආයතනික ව්‍යවසායකයින් ලෙසය.
2. සමාජීය ව්‍යවසායකයින් ලෙසය.
3. සමාජ සුභසාධකයින් ලෙසය.
4. අභ්‍යන්තර ව්‍යවසායකයින් ලෙස ය.

(34) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයකි.

1. ස්වයං තෘප්තිය
2. ප්‍රාදේශීය සංවර්ධනය
3. රැකියා ජනනය
4. දේශීය සම්පත් භාවිතය

(35) අවශ්‍යතා හා ඊට අදාළ වුවමනා නිවැරදිව සඳහන් ප්‍රකාශය වන්නේ,

1. අධ්‍යාපනය - දුරකතනය
2. ආරක්ෂාව - ත්‍රිවිද හමුදාව
3. ප්‍රවාහනය - පාසල්
4. සෞඛ්‍යය - පොත්පත්

(36) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා මිනිසා විසින් නිපදවා ඇති සියලු සම්පත් හඳුන්වන්නේ,

1. භූමිය ලෙසය.
2. ශ්‍රමය ලෙසය.
3. ප්‍රාග්ධනය ලෙසය.
4. ව්‍යවසායකත්වය ලෙසය.

(37) විවිධත්වය ග්‍රහනය කර ගැනීම.

1. නිර්මාණශීලීත්වයට බාධාවකි.
2. නවෝත්පාදනයට බාධාවකි.
3. නිර්මාණශීලීත්වය වර්ධනය කරගන්නා ක්‍රියාමාර්ගයකි.
4. නවෝත්පාදන වර්ධනය කරගන්නා ආකාරයකි.

(38) පවතින සංකල්ප හෝ සාධකවල නව සංයෝගයක් හෝ මිශ්‍රණයක් භාවිතා කර නව නිපයුම් කිරීම.

1. සංකලනයකි.
2. දිගුවකි.
3. අනුකරණයකි.
4. ක්‍රියාවලි අවශ්‍යතාවකි.

(39) ව්‍යාපාරිකයින් විසින් ඉතා ආසන්න ඉලක්ක ඇති කර ගැනීම සඳහා උදාහරණයකි.

1. නව වෙළඳපොළ සොයා යාම.
2. ඉක්මන් ලාභ ලැබීම.
3. වෙළඳපොළේ දිගුකල් රැඳී සිටීම.
4. තරඟයට මුහුණදීම.

(40) ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම මගින් පෙන්නුම් කරන්නේ,

1. රට තුළ දිළිඳු ජනගහනය අඩු වීමයි.
2. සුළු පිරිසක් පොහොසත් වීමයි.
3. රට තුළ දිළිඳු ජනගහනය වැඩි වීමයි.
4. ආදායම සාධාරණව බෙදී යාමයි.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

63 | S | II

**පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020**

**First Term Test - Grade 10 - 2020**

**නම/විභාග අංකය : ..................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - II**

වැදගත් :

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර තෝරාගන්නා සෙසු ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමීර මහතා වෙනස් වන පරිසරයට අනුව වෙනස්වීමට කැමති නිර්මාණශීලී පුද්ගලයෙකි. කුඩා ළමුන් පවා සීනි හා කොලෙස්ටරෝල් යන රෝග වලින් පෙළීමේ ප්‍රවණතාවක් වර්තමානයේ පවතින බව අවබෝධ කරගත් සමීර මහතා මේදය හා සීනි රහිත ඖෂධීය කොළ කැඳ පානයක් ප්‍රදේශයේ පවතින පාසල් වල සිසුන්ට හඳුන්වා දීමට අදහස් කරයි.

ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා තමා පදිංචි නිවස ඉදිරිපිට ඉදිකර ඇති කඩකාමරයක් යොදා ගැනීමටත් ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගැනීමටත් අදහස් කරයි. නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය තමා පදිංචි ප්‍රදේශයෙන් ම සපයා ගැනීමටත් සේවකයින් තිදෙනෙක් බඳවා ගැනීමටත් අදහස් කරයි.

ව්‍යාපාර කටයුතු සිදු කිරීම මගින් මාසයකට රු. 30 000 ක පමණ ලාභයක් ඉපයීමට අදහස් කරන සමීර මහතා එම ලාභයෙන් කොටසක් පාසල්වල ආර්ථික අපහසුතා ඇති දරුවන් වෙනුවෙන් වියදම් කිරීමටත් අදහස් කරයි.

i) සමීර මහතා තුළ ඇති ව්‍යවසායකත්ව ගුණාංග 2 ක් නම් කරන්න.
ii) සමීර මහතා විසින් ඉටු කරනු ලබන අවශ්‍යතාවය හා වුවමනාව සඳහන් කරන්න.
iii) සිද්ධියෙහි සඳහන් වන නිෂ්පාදිතයෙහි නම සඳහන් කරන්න.
iv) සිද්ධියෙහි සඳහන් භූමිය නමැති නිෂ්පාදන සාධකයට අදාළව උදාහරණ 2 ක් සපයන්න.
v) සමීර මහතාගේ ව්‍යාපාරයේ ප්‍රාග්ධනය නමැති නිෂ්පාදන සාධකයට අදාළව උදාහරණ 2 ක් ලියන්න.
vi) මෙම ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමෙන් සමීර මහතාට හිමිවිය හැකි ප්‍රතිලාභ 2 ක් ලියන්න.
vii) සමීර මහතාගේ ව්‍යාපාරය නිසා දේශීය ආර්ථිකයට හිමිවිය හැකි ප්‍රතිලාභ 2 ක් ලියන්න.
viii) සමීර මහතා අයත් වන ව්‍යවසාය වර්ගය සඳහන් කරන්න.
xi) සිද්ධියේ සඳහන් නවෝත්පාදනය සිදු වන ආකාරය සඳහන් කරන්න.
x) සිද්ධියේ සඳහන් නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රය සඳහන් කරන්න.

(ල: 2x10 = 20 යි)

(02) i) ව්‍යවසායකත්වය යන්න ඔබට හැගෙන පරිදි නිර්වචනය කරන්න.
ii) භූමිය නමැති නිෂ්පාදන සාධකය සඳහා උදාහරණ 2 ක් ලියන්න.
iii) නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක 4 ක් ලියන්න.
iv) නවෝත්පාදන සිදු වන ආකාරයක් වන නව සොයා ගැනීමක් සඳහා උදාහරණ 4 ක් ලියන්න.
v) අවදානම හා ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2x5 = 10 යි)

NWP EXAM

(03) i) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර 4 ක් ලියන්න.

ii) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 2 ක් ලියන්න.

iii) මිනිසුන්ට ඇති වන අවශ්‍යතා 4 ක් ලියන්න.

iv) ව්‍යාපාරයක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

v) ප්‍රාග්ධනය නමැති නිෂ්පාදන සාධකය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2X5 = 10 යි)

(04) i) ඔබ ජීවත් වන ප්‍රදේශයේ හෝ ඔබේ පාසල තුළ හෝ පවතින ගැටලුවක් හඳුනා ගෙන ඒ සඳහා ඔබට ඉදිරිපත් කළ හැකි විසඳුමක් ලියන්න.

ii) පුද්ගලයෙකු තුළ ඇති නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ක්‍රම 4 ක් සඳහන් කරන්න.

iii) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරනු ලබන සේවාවක දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.

iv) ව්‍යවසායකත්ව ගුණාංගයක් වන නිර්මාණශීලීත්වය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

v) ව්‍යාපාර ව්‍යවසායකත්වය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2X5 = 10 යි)

(05) i) ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ 4 ක් ලියන්න.

ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති වෙනස්කම් 2 ක් ලියන්න.

iii) අභ්‍යන්තර ව්‍යවසායකයින් සඳහා උදාහරණ 2 ක් ලියන්න.

iv) නිෂ්පාදන සාධක අතර ව්‍යවසායකත්වයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

v) නම්‍යශීලීත්වය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2X5 = 10 යි)

(06) i) ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ සිදුවන වෙනස්වීම් නිසා බිහි වී ඇති ව්‍යාපාර අවස්ථා 2 ක් ලියන්න.

ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති සමානකම් 4 ක් ලියන්න.

iii) ව්‍යවසායකත්ව කාර්යයේ නිරතවීමෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 2 ක් ලියන්න.

iv) සමාජයීය ව්‍යවසායකයා යනු කවරෙක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

v) ව්‍යවසායකත්ව කාර්ය මගින් රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2X5 = 10 යි)

(07) i) අධ්‍යාපනය නමැති අවශ්‍යතාවය ඉටු කරගැනීමට ඇති වුවමනා 4 ක් ලියන්න.

ii) සමාජයීය පරිවර්තනයක් කිරීමට ඉදිරිපත්ව සිටින ව්‍යවසායකත්වය ක්‍රියාත්මක වන මට්ටම් 2 ක් ලියන්න.

iii) වර්තමාන සමාජය මුහුණ දී සිටින, ''සමාජයීය ව්‍යවසායකයින්ට'' විසඳුම් ලබාදිය හැකි ප්‍රශ්න 4 ක් ලියන්න.

iv) ව්‍යාපාර විසින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් 2 ක් ලියන්න.

v) භාණ්ඩයක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල: 2X5 = 10 යි)

NWP EXAM

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

63 S I,II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 10 - 2020

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 1 | (11) | 4 | (21) | 1 | (31) | 1 |
| (2) | 3 | (12) | 1 | (22) | 4 | (32) | 4 |
| (3) | 3 | (13) | 2 | (23) | 4 | (33) | 2 |
| (4) | 1 | (14) | 3 | (24) | 3 | (34) | 1 |
| (5) | 4 | (15) | 1 | (25) | 2 | (35) | 2 |
| (6) | 2 | (16) | 4 | (26) | 3 | (36) | 3 |
| (7) | 3 | (17) | 3 | (27) | 2 | (37) | 3 |
| (8) | 2 | (18) | 1 | (28) | 3 | (38) | 1 |
| (9) | 2 | (19) | 3 | (29) | 3 | (39) | 2 |
| (10) | 1 | (20) | 2 | (30) | 2 | (40) | 4 |

## II පත්‍රය

(01) i) * නම්‍යශීලීත්වය * නිර්මාණශීලීත්වය * නවෝත්පාදනීය බව

ii) * ආහාර අවශ්‍යතාවය වුවමනාව - සීනි හා මේදය රහිත ඖෂධීය කොළ කැඳ පානය

iii) සීනි හා මේදය රහිත ඖෂධීය කොළ කැඳ පානය

iv) * කොළ වර්ග * ගොඩනැගිල්ල පිහිටි ඉඩම * වාතාශ්‍රය * පොල් * හිරුඑළිය

v) * ගොඩනැගිල්ල * ඇඹරුම් යන්ත්‍රය

vi) * ලාභයක් හිමිවීම. * සමාජ සුභසාධනයට දායකවිය හැකිවීම.

vii) * රැකියා අවස්ථා ලැබීම. * දේශීය සම්පත් භාවිතයට ගැනීම. * ප්‍රාදේශීය සංවර්ධනයක් ඇතිවීම.
* මිනිසුන්ට ආදායම් මාර්ග බිහිවීම. * මිනිසුන්ගේ ජීවන තත්වය උසස්වීම.

viii) * ව්‍යාපාර ව්‍යවසායකත්වය

ix) * දිගුවක්

x) වෙළඳපොලේ වෙනස්වීම්

(02) i) පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනා ගනිමින් අවදානම් දරමින් නිර්මාණශීලිත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලියේ යෙදීම ව්‍යවසායකත්වයයි.

ii) * අමුද්‍රව්‍ය * වනාන්තර * වාතාශ්‍රය * ඉඩම් * පස * හිරු එළිය

iii) * විශ්වාසය හා ආකල්ප කෙරෙහි කදබල ලෙස ගැලී සිටීම. * ගැටලුවකට එකම විසඳුමක් ඇතැයි සිතීම.
* තාක්ෂණික ප්‍රතිලාභ අපේක්ෂා කිරීම. * තර්කානුකූලව පිහිටා කටයුතු නොකිරීම.
* ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම. * විවේචන හා වැරදිවලට බිය වීම.

iv) * දුරකතන * විදුලි බල්බය * විද්‍යුත් වෙළඳාම (ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

v) අවදානම ඉහළ නම් ප්‍රතිලාභ ද ඉහල ය.
අවදානම පහළ නම් ප්‍රතිලාභ ද පහළ ය.

(03) i) * අනපේක්ෂිත සිදුවීම් * ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වන වෙනස්කම්
* ක්‍රියාවලී අවශ්‍යතා * සංජනනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම.
* වෙළඳපලේ වෙනස්වීම් * දැනුම පදනම් කරගත් සංකල්ප

ii) අවශ්‍යතා / වුවමනා
* මූලිකව පැන නගියි. * ද්විතීයිකව පැන නගියි.
* සීමිතය * අසීමිතිය
* සියලු දෙනාට පොදුය. * පෞද්ගලික වේ.
* නිර්මාණය කළ නොහැක. * නිර්මාණය කළ හැකිය.

iii) * ආහාර * ඇඳුම් * වාසස්ථාන * අධ්‍යාපනය * සෞඛ්‍ය
* සන්නිවේදනය * ආරක්ෂාව * ප්‍රවාහනය * විනෝදය

iv) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ සියලුම කටයුතු ව්‍යාපාර ලෙස හැඳින්වේ.

v) නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වන මිනිසා විසින් නිපදවා ඇති සියලුම සම්පත් ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ.

(04) i) ගැලපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න.

ii) * විවිධත්වය ග්‍රහණය කර ගැනීම. * අසාර්ථකත්වය ඉවසීම.
* කුතුහලය දිරිමත් කිරීම. * ගැටලු අභියෝග ලෙස දැකීම.
* නිර්මාණශීලී පුහුණු අවස්ථාවලට යොමු වීම. * නිර්මාණශීලීත්වය අගය කිරීම.
* නිර්මාණාත්මක හැසිරීම ආදර්ශණය කිරීම.

iii) * අස්පෘශ්‍ය වේ. * ගබඩා කළ නොහැක.
* සමජාතීය බව ආරක්ෂාකළ නොහැක. * පාර්භෝගිකයා බොහෝ විට නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය වීම.
* සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීම.

iv) ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාවයි.

v) ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරත වන්නෝය.

(05) i) * සම්පත් ගනුදෙනුවල යෙදවීම. * ගනුදෙනු අඛණ්ඩව සිදුවීම. * අරමුණක් පැවතීම.
* අවදානමක් පැවතීම. * මූල්‍යමය ගනුදෙනු සැලකිල්ලට ගැනීම. * ආර්ථික කටයුත්තක් වීම.

ii) ව්‍යවසායකයා / ව්‍යාපාරිකයා
* හොඳින් තක්සේරු කර දැරිය හැකි අවදානම් පමණක් භාර ගනියි. * අවදානම් භාර ගැනීමට කැමැත්තක් නොදක්වයි.
* තරඟය කැමැත්තෙන් සොයා යයි. * තරඟයට එතරම් කැමැත්තක් නොදක්වයි.
* පවතින සම්පත් උපරිම ප්‍රයෝජනයට ගනියි. * පවතින සම්පත්වලින් පවා උපරිම ප්‍රාග්ධනයක් ගැනීමට සිදු නොවේ.
* දිගුකාලීන ඉලක්ක ඇති කර ගනියි. * ආසන්න ඉලක්ක ඇති කර ගනියි.

iii) ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.

iv) සමාජයේ පවතින ප්‍රශ්නවලට නිර්මාණශීලීව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝය.

v) පරිසර වෙනස්වීම්වලට උචිත වන පරිදි අනුගත වීමට ඇති හැකියාවයි.

(06) i) * දිවා සුරැකුම් මධ්‍යස්ථාන * වැඩිහිටි සැරැකුම් මධ්‍යස්ථාන* විශ්‍රාමික නිවාස
ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.

ii) * ආර්ථික කටයුත්තක නිරතවීම. * අවදානමට මුහුණ දීම * ගනුදෙනුවල නිරත වීම.
* සම්පත් භාවිතා කිරීම. * තරඟයට මුහුණ දීම. * ස්වයං පෙළඹවීමක් තිබීම.

iii) * දේශීය සම්පත් උපයෝජනය කිරීම. * ප්‍රාදේශීය සංවර්ධනයක් සිදු වීම.
* නව භාණ්ඩ හා සේවා වෙළඳපොළට පැමිණීම. * රැකියා අවස්ථා ජනනය කිරීම.
* විදේශ විනිමය ඉපයිය හැකි වීම. * ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීම.

iv) සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝය.

(07) i) පොත්, පාසල්, දහම් පාසල්, පෞද්ගලික පංති (ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.)

ii) * ප්‍රදේශීය * ජාතික * අන්තර්ජාතික

iii) * මත්ද්‍රව්‍ය උවදුර * පෝෂණ ගැටලු * වසංගත රෝග පැතිරයාම

iv) * මිනිස් අවශ්‍යතා හා වුවමනා පසුරාලීමට භාණ්ඩ හා සේවා නිපදවීම. * බෙදාහැරීම ආශ්‍රිත කටයුතු

v) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ඇති භෞතික දෑ භාණ්ඩ ලෙස හැඳින්වේ.